# ජන කවිය මගින් නිරූපිත අතීත සමාජ මානවයාගේ ලිංගිකත්වය පිළිබඳ ව සිදු කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්

*එම්.එම්. සිහින සඳරුවන්[1] එම්.එච්.එච්. හිල්මියා[2]*

පරම්පරාගත ව සිංහල මිනිසාට හිමි වූ ජන සාහිත්‍යාංගයක් ලෙසින් ජන කවිය වැදගත් වන අතර පොදු ජනයා පරම්පරාවෙන් පරම්පරාවට කටින්කට පවත්වාගෙන එන කවි විශේෂයක් ලෙසින් ජනකවිය හඳුනාගත හැකි ය. ජන කවිය අනාදිමත් කාලයක සිට හෙළයේ සංස්කෘතික හරයන් ප්‍රතිනිර්මාණයෙහි ලා දායක වන ජන කවිය එදිනෙදා ජීවිතයේ ගැමියන්ට මුහුණ දීමට, අත්විදීමට සිදු වූ සිදුවීම්, ජීවිතයේ ගැටලුකාරී තත්ත්වයන් මෙන් ම ජන කවිය මගින් අතීත හෙළ සමාජයේ බොහෝ තැන් විවරණය කරනු ලැබේ. එහි දී ජන කවිය මගින් නිරූපිත ප්‍රධාන මාතෘකාවක් වෙනුයේ 'ලිංගිකත්වයයි' ගජමන් නෝනා වැනි කිවිඳියන්ගේ ජන කවි මගින් ද ගැමි සමාජයේ ලිංගිකත්වය සරල සහ සුගම ලෙසින් 'කුණුහරපයක්' බවට පත් නො කර ලිංගිකත්වය විවරණය කර තිබෙන අතර පැල් රැකීම එදා ජන ජීවිතයේ ප්‍රධාන වෘත්තියක් වූ අතර මේ තත්ත්වයන් තුළ අඹුවන් හා සැමියන් අතර පවත්නා ලිංගිකත්වය ජන කවිය මගින් නිරූපණය කර තිබෙන අවස්ථා තිබේ. ජන කවිය මගින් නිරූපිත අතීත සමාජයේ ලිංගිකත්වය කවරාකාර ද යන්න හා ලිංගිකත්වයේ විවිධ මානයන් මොනවා ද යන්න මෙම පර්යේෂණයේ මූලික ගැටලුව වූ අතර ජන කවිය පිළිබඳ ව හඳුනා ගැනීමත්, අතීත ගැමියාගේ ලිංගිකත්වය සහ ලිංගිකත්වය සම්බන්ධයෙන් අතීතයේ පැවැති සමාජ ආකල්පය මෙන් ම ලිංගික නිදහස පිළිබඳ ව හඳුනා ගැනීමත් මෙම පර්යේෂණයේ මූලික අරමුණු විය. මෙම අධ්‍යයනයට ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කළේ ය. එහි දී දත්ත රැස් කිරිමට ද්විතියික මූලාශ්‍රය ක්‍රමය යටතේ මේ සම්බන්ධයෙන් රචනා වී ඇති පොත් පත්, පුවත් පත්, සඟරා මෙන් ම අන්තර්ජාලය ආශ්‍රිත ලිපි ද භාවිත කරන ලදි. දත්ත විශ්ලේෂණයේ දි ජන කවි විවිධ මානයන් ඔස්සේ වර්ග කොට ලිංගිකත්වය හා සම්බන්ධ ජනකවි හඳුනා ගනිමින් දත්ත විග්‍රහ කරන ලදි. එහි දී අතිතයේ පැවැති ලිංගික චර්යාවන්, ලිංගික විෂමතා, ලිංගික අනන්‍යතාවන්, ලිංගික විෂමතා පිළිබඳ ව හඳුනාගත හැකි විය. ඒ යටතේ අනියම් ඇසුර, කාන්තාවන්ගේ ශරීරය සම්බන්ධ ව පිරිමින්ගේ ආකල්ප, පිරිමින් ආකාර්ෂණය කරගත් කාන්තාවන් සිටි බව, වයස්ගත පුද්ගලයන්ගේ ලිංගිකත්වයට බලපෑම් එල්ල වීම, පිරිමියා මිය ගිය පසු කාන්තාවන් අනෙක් පිරිමින් හා ලිංගික ව එක් වීම, විවාහ ක්‍රමයන්හි පවත්නා ලිංගිකත්වයේ විෂමතාව, ලිංගිකත්වය කෙරෙහි පැවැති පොදු නීතින් වැනි කාරණා ගණනාවක් මෙන් ම පැල් රැකීම හමුවේ පිරිමින් හා කාන්තාවන්ගේ ලිංගික ක්‍රියාකාරිත්වය වැනි තත්ත්වයන් පැවැති බව අවබෝධ කරගත හැකි ය. මෙම පර්යේෂණය තුළ දත්ත විශ්ලේෂණයේ දි එළඹිය හැකි අවසාන නිගමනය වනුයේ වර්තමානයේ තරම් ලිංගිකත්වය ව්‍යාජත්වයක් මතු කරගත් යුගයක් නොවන අතර ගැමි සමාජයේ ලිංගිකත්වය සරල මෙන් ම සමාන්‍ය, සරල දෙයක් ලෙස පිළිගත් බව වෙයි.

***ප්‍රමුඛ පදඃ*** ජන කවිය; ලිංගිකත්වය; අනියම් ඇසුර; ව්‍යාජත්වයක්; සරල

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. sihinasandaruwan2000@gmail.com
[2] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. hairulhilmiya02@gmail.com